# අලි ඇතුන් සහ අපි
# එද සහ මෙද

බුද්ධිමත් සත්වයෙක් වන අලියා වැව් සෑදීම හා යුද්ධය වැනි විවිධ කාර්යයන්හිදී අතීතයේ මිනිසා හා එක්ව උරෙනුර ගැටී කටයුතු කළ සතෙකි. එදා ඌ අපගේ හිතවතෙක් සහ මිත්‍රයෙක් විය. එබැවින්ම "වල් අලියා" නැමති සතෙක් පුරාණයේ නුවූ අතර, අලින්ගෙන් මිනිසාට හෝ ගොවිතැනට උපද්‍රවයක් නොවීය. එසේ වුවද සුදු මිනිසාගේ කෝපි වතු ආරම්භවීම සමග අලි - මිනිස් සම්බන්ධය වෙනස් වී මේ වර්තමාන අලි - මිනිස් ගැටුම්වල ආරම්භය ද විය.

වැව් සෑදීමේදී දමන ලද පස් තලා තද කළ යුතු වූ විටදී පාවිච්චි කළේ ඇත් අඩියයි. වර්තමානයේ ගල් රෝලෙන් කෙරෙන එම කාර්යය එදා අලි ඇතුන් ලවා කරවා ගැනීම වැව් බැම්මෙහි ශක්තිය රඳා පැවතුනේ ඊට දැමුණු පස් හොඳින් තලා තද කිරීම මතය. තිස්පත් දහසක් පමණ වන ලොකු කුඩා වැව් සමූහය නිර්මාණය කිරීමට මේ අනුව ඇත් ශ්‍රමය කෙතරම් යෙදවෙන්නට ඇත්දැයි සිතා ගත හැකිය.

එපමණක් නොව ඉතා කුඩා ගම්දනව්වල පමණක් මඩ කලතා පිට කිරීමට මී හරකුන් යොදා ගත් අතර ඉතිරි හැම වැඩකදීම එම කාර්යය සිදු වුනේ අලි ඇතුන් විසින්. නිකිණි (අගෝස්තු) මාසයේදී වැව් ශුද්ධ කර මඩ හා රොන්මඩ කලතා වැවෙන් පිට කිරීමෙන් අවශ්‍ය වුනේ වැව් අවසාධිත තැන්පත්වී වැව ගොඩවීම වැළැක්වීම සඳහාය. නිකිණියේ දින කිහිපයක් තුළදී මුළු ලංකාව පුරා මෙම කාර්ය ඉටුවිනා. මෙම කෙටි කාලය තුළදී අලි ඇතුන්ගේ සේවය ලබාගැනීම සඳහා ගම්වලට ගෙනවුත් උන් හීලෑ කරගෙන කන්ට බොන්ටදී අවුරුද්ද පුරා පෝෂණය කිරීම දුෂ්කර කාර්යයකි. එබැවින් එම අවස්ථාවට කැලයෙන් අලි කැඳවාගෙන අවුත් වැව් රාජකාරීවලට යොදවාගෙන පසුව උන් මුදා හැරීම සිරිත විය. මුළු රටපුරා වාරි කර්මාන්ත වැඩ හොඳින් කෙරෙන බවට වගබලා ගැනීම රජුගේ කාර්යයක් (රාජකාරිය) විය. මෙම කටයුත්තට අලි ඇතුන්ගේ සහභාගිත්වය පෙන්වන පහත සඳහන් ජනකවිය හොඳ නිදසුනකි.

කන්දේ කකා ලන්දේ යන — බෝසත්තු
අත මිණි බැඳ පය මිණි බැඳ — ජයගත්තු
රාජ සබෙන් හොඳ කරුණා — ලැබගත්තු
වලවේ ගඟට බැස්සයි ගෝමර — ඇත්තු

තිදැල්ලේ කකා යන අලි ඇතුන් කැඳවාගෙන අවුත් ප්‍රිය කරන සීනු, මිණිගෙඩි හා ගෙජ්ජි අත්පය වල බැඳ වැව් රාජකාරියේ යෙදී රජුගේ ප්‍රසාදය දිනාගෙන වලවේ ගඟෙන් එතෙර වී ආපසු යාමේ පුවතක් මෙම කවියෙන් කියැවේ. මෙහිදී රජු ගැන සඳහන් වන්නේ රටේ වාරි කර්මාන්තයේ ප්‍රධානියා රජුවීම නිසාය. මෑත යුගයේ සිදුවූ මෙම සිද්ධිය නිසා වැව් බැඳීමක් නොව ශුද්ධ කිරීමට අලි ඇතුන්ගේ සහායවීමත් ගැන සඳහන් වන බව සැලකිය හැකිය. අද ඇති වැව් සියල්ලම වාගේ අනුරාධපුර යුගය අවසන්වන විට තනා නිමවී තිබූ බව ඒ ගැන අවධානය කළ විද්වතුන්ගේ අදහසයි.

අද දින අලියාගේ කාර්යය ද වාණිජ වී ඇත. දැව ප්‍රවාහනය හා පෙරහැරවල යාම යන කටයුතු දෙකට උගේ අවශ්‍යතාව දැන් සීමා වී තිබේ. එමෙන්ම කෝපි, තේ, රබර් හා පොල්වතු වගා කිරීමේදී අලියා මිනිසාගේ සතුරෙකුවීම ද 19 වැනි සියවසේදී දක්නට හැකි විය. වර්තමානයේදී අලින් ඇත් ගාලක දමාගත් පසු උගේ වන වාසය සදහටම අහිමි වෙයි. ඉන්පසු ඌ මිනිසා සමග ගමේ වසමින් වාණිජ කටයුතුවලට සහාය වන 'කම්කරුවෙකු' බවට පත්වේ. මේ නිසා උගේ මුළු ජීවිත කාලය තුළ එම සත්ත්වයා නඩත්තු කිරීමට හාම්පුතාට සිදුවේ. මෙම හේතුව නිසා අද දින අලියෙකුගේ අයිතිකරුවෙක් යනු ගමේ ගොවියෙක් නොව ඉඩම් හිමි වැවිලිකාර ධනපතියෙකි. අලියෙකුගේ අයිතිකරුවීම ද ධනවත්බවේ සංකේතයකි.

සිංහල වෙදකම තුළ සත්ත්ව වෙදකම ද නිතැතින්ම ඇති අතර එය මූලික වශයෙන් ගව සහ අලි වෙදකමට සීමාවේ. ගොවියා සමග උරෙනුර ගැටී කටයුතු කරමින් ඔහුගේ කටයුතුවලට සහායවූ සතුන් දෙදෙනා ගවයා සහ අලියා වීම ඊට හේතුවය. කෞතුකාගාරයේ ඇති පුස්කොළ පොත්වලින් උපුටාගත් ඇත් වෙදකම පිළිබඳ විස්තරයක් පී. ඊ. පී. දැරණියගල මහතා විසින් ප්‍රකාශයට පත් කර ඇත.

ගොඩබිම පොළොව සීසෑම සඳහා ද ඇත් නඟුල ප්‍රයෝජනයට ගත් අතර එය අඳින ලද්දේ අලි ඇතුන් විසිනි. මෙය ඇත් අඩියෙන් සී සෑම ලෙස

විස්තර කෙරේ. ට්‍රැක්ටර් ඒමට ප්‍රථම වයඹ පළාතේ පොල්වතු සී සෑමට ද ඇත් නඟුල භාවිත විය.

ලොව පුරා සිටින අලි ඇතුන් එක හා සමාන බුද්ධියෙන් යුක්ත නොවේ. අප්‍රිකානු අලියා සහ ආසියානු අලියා යනුවෙන් අලි ඇතුන් ප්‍රධාන වර්ග දෙකකට යටත් කෙරේ. මෙහි කැපී පෙනෙන විශේෂ ලක්ෂණය නම් අප්‍රිකානු අලියා බුද්ධියෙන් හීන වීමය. උගෙන් ගොවිතැන හෝ දැව ප්‍රවාහනය නුපුළුවන. හීලෑකර වැඩට යෙදවීම අතින් අප්‍රිකානු අලියා ඉතා පහළ මට්ටමක සිටී. නිදසුනක් ලෙස දැනට දෙහිවල සත්තුවත්තේ අවුරුදු 40ක් සිටි අප්‍රිකානු අලියා අදත් වල් අලියෙකි. ඌ තවමත් ගැටගසා කන්ට බොන්ට දීම කෙරේ. අවුරුදු 40ට පසුව ද ඌ නිදැල්ලේ හැරීමට හැකි තත්ත්වයට හීලෑකර ගැනීමට සත්තුවත්තේ අධිකාරීන්ට නොහැකිවීම මෙයට හොඳම නිදසුනකි. නමුත් ශ්‍රී ලංකාවේ පෙරහැරේ ගමන් කරන අලියා ඉතා සංවරශීලි හා විනය ගරුක සත්ත්වයෙකි.

වර්තමානයේ පවා කැලෑබද ගම්මානවල වැඩිහිටියන්ට පමණක් නොව දරුවන්ට පවා 'වල් අලියා' භයානක සතකු නොවේ. 1964 අවුරුද්දේ සීගිරියට නොදුරු 'පොල් අත්තාව' ගමේ වයස 16ක පමණ ශිෂ්‍යයෙක් මට ප්‍රකාශ කළේ ඔවුන් රාත්‍රියට අලින්ට කොලොප්පම් කර උන්ව කේන්ති ගස්සවන බවය.හැන්දෑවේ 6.00 ට චිත්‍රපටි දර්ශන බැලීමට බයිසිකල්වලින් දඹුල්ලේ සිනමාහලට එන ඔවුහු ආපසු යන විට මහා මාර්ගයේ එකල අලි සිටියහ. අලියාට කොලොප්පම්කර උන් කේන්ති ගන්වා ගමන් පසුපස එලවාගෙන ඒමට සලස්වා බයිසිකලය වේගයෙන් පදවා ආරක්ෂා වී යාම මෙම ගැටවුන්ගේ විනෝදාංශයක් වී තිබුණි. 'අපි අලියට කතා කරලා බයිසිකලය පදිනවා' යනුවෙන් එම ශිෂ්‍යයා පැවසූ විට අලියාට කතා කරන්නේ කෙසේදැයි මම විමසීමි. 'වී ගෙරියාඃ' කියලයි කියන්නේ එවිට ඌ අප පසුපස එලවනවා, අපි බේරිලා බයිසිකලය පැදගෙන යනවා, යනුවෙන් ඔහු එය වඩාත් පැහැදිලි කෙළේය.

එමෙන්ම 1983 ජූලි පසළොස්වක පොහෝ දින සෝමාවතී චෛත්‍යයේ ඇසළ උත්සවයට ගිය අපි හැන්දෑවේ මහවැලි ගඟට ගොස් නාගෙන ගොම්මං (ඉර බසින) වෙලාවේ ආපසු නවාතැනට ඒමට පිටත්වීමු. එවිට තරුණ මවක් වැඩිමල් දරුවා අතින් අල්ලාගෙන අත දරුවා වාගෙන රාත්‍රිය ගත කිරීමට හේනට යමින් සිටියාය. අප සමග සිටි වැඩිහිටියා වූ මුදියන්සේ තෙන්නකෝන් මහතා මෙසේ ඇසීය. "අද තනියා මේ පැත්තේ ගැවසෙද්දී නගා විතරක් මේ ගොම්මං වෙලාවේ පැල් රකින්න යන්නේ" ඇයගේ ක්ෂණික පිළිතුර වූයේ මෙයයි. "ඉතින් අය්යා අපිත් ඉන්න ඕනැ, අලියත් ඉන්න ඕනැ" යනුවෙනි. වියළි කලාපයේ කැලෑබද ගම්මානවල නයා, පොළඟා ගැසීම මිස අලියා ගැසීමක් ගැන ඇසීම දුර්ලභය. වියළි කලාපයේ ගැමියාට අලියා කිසිවිටක සතුරකු ලෙස පෙනී නැත. එසේ වුව ද 1983 ජූලි පසළොස්වක දින අපි සෝමාවතියට යද්දී පළුගස්වැව අසලදී මහා මාර්ගය අයිනේ උස් අට්ටාල සාදා තිබෙනු දැක ඒ ගැන විමසීමු. ඔවුන් කීවේ රාත්‍රියට අලියා අවුත් ගෙවල්වලට හානි කරන බවත්, එබඳු අවස්ථාවලට ගෙවල්වල අය අට්ටාලවලට නැගී ආරක්ෂා වී රතිඤ්ඤා පත්තුකර රත්වූ පොල්කටු අඟුරු හොඩයට විසිකරන බවය. එවිට අලියා පසුබැස යන බවත්ය. මුදියන්සේ තෙන්නකෝන් මහතා එක්වරම කීවේ මොවුන් වියළි කලාපීය ගැමියන් විය නොහැකි බවය. ඔවුන්ගේ මුල්ගම් කොහේදැයි අපි විමසීමු. හලාවත, බොරලැස්ස, උඩප්පුව, කල්පිටිය ආදී වශයෙන් පිළිතුරු ලැබිණ. මොවුහු පළුගස්වැවට සංක්‍රමණය වූ වයඹ වෙරළබඩ ධීවරයෝ වූහ. එබැවින් ඔවුහු පළුගස්වැවට ආගන්තුකයන් ද වූහ.

අලියා මිනිසාගේ සතුරෙකු වුනෙත්, වල් අලියා වුනෙත් යුරෝපීය වැවිලිකරුවන් හා සුදු නිලධාරීන් විසින් අලි මැරීම පටන්ගත් පසුවය. වැවිලි කරුවාට වැවිලි ආරක්ෂා කර ගැනීමටත්, නිලධාරියාගේ විනෝදයටත් අලි මැරීම සිදුවිය. අලින්ගේ වාසභූමි මංපෙත් අවහිරවන පරිදි කෝපි වතු ඇරඹීම නිසා අලි - මිනිස් සටන් ඇරඹිණ. එදා සිට කැලේ වසන අලියා වල් අලියාම විය. ඌ කුඩා කාලයේදීම අල්ලාගෙන හීලෑ කරගත් විට පමණක් මිනිසාට ප්‍රයෝජනවත් හීලෑ සතකු විය. වන පෙත් එළිවීම හා දැව කැපීම 19 වැනි හා 20 වැනි සියවස්වලදී සීඝ්‍රයෙන් සිදුවීම නිසා කම්කරුවකු හා වහලකු ලෙස වැඩ ගැනීමට අලියා ද අවශ්‍ය විය. අතීතයේ මෙන් සුහද මිනිස් - අලි සබඳතාවක් නොවීය. හෙණ්ඩුවෙන් අනිමින්, කෙවිටෙන් පහර දෙමින් පරිභව කරමින් අලියාගෙන් වැඩ ගැනීම බීමත් ඇත් ගොව්වන්ගේ අද දින සම්ප්‍රදායයි.

සුද්දන් විසින් අලි මරණ ලද්දේ දුසිම් ගණනින් නොව දහස් ගණනින්ය. අලින් 1800ක් මැරීමෙන් වාර්තාවක් තබන ලද ඉංග්‍රීසි ජාතිකයෙකු ගැන

අසන්නට ඇත. මෙයින් අපේ සිහියට නැඟෙන්නේ අංගුලිමාල චරිතයයි. සුදු මිනිසා කළ වරදට අහිංසක ගැමියාට පව් ගෙවීමට සිදුවිය. අලියා සටනට අවේ කළු සුදු භේදයක් නොතකා මිනිස් වර්ගයා සමගය. එමෙන්ම කැලෑව ක්‍රම ක්‍රමයෙන් අතුරුදහන් වන විට ගොවි බිම්වලට අවුත් වගා පාළු කිරීමට ද අලින්ට සිදුවිය. මේ නිසා අනුක්‍රමයෙන් ගොවියා ද තමන්ගේ සතුරෙකු ලෙස අලියා ගැන සිතීමට 20 වන සියවසේදී පුරුදු විය. මෙම තත්ත්වය අදත් පවතී.

කැලේ සිටින අලියා ජල හිඟකාලයට ගමේ වැවට ඒම වැලැක්වීමට අප මුතුන් මිත්තෝ පියවර ගත්හ. එනම් **'ලන්දේ වැව් බැඳීමයි'** ගමට නුදුරු ලඳු කැලෑවල වැව් බැන්දේ අලින්ගේ ප්‍රයෝජනය සඳහාය. මෙය කුරුල්ලන් සහ කුඹුරු යායේ **'කුරුළු පාළුව'** වගා කිරීමට සමානය. නියං සමයේ අලින් සඳහා වැව් බැඳ ජලය රැස්කර තැබූ විට ගම්මානයට ඒමට උන්ට අවශ්‍ය විය. ඉන් ගම්වල කුඹුරු සහ බව භෝග ආරක්ෂා වුණි.

වනාන්තරය විනාශවීමත් සමගම ලංකාවේ අලි පරපුර අනාථ වී ඇත. එමනිසා 'අලි අනාථාගාර' අද බිහිවී තිබේ. වන විනාශයත් සමග අලින් ගම්වලට වැදී වගා විනාශ කිරීම ද එමගින් උන්ට ඉක්මණින් මරණය ළඟාවීමත් දක්නට පුළුවන. මේ සියල්ලටම මූල සංවර්ධනයයි. සංවර්ධනය සඳහා කැලෑව අතුරුදහන්විය යුතුය. අනතුරුව මහ පොළොව ගෙවල් සෑදීම සඳහා ගත යුතුය. එබැවින් බිලිපිත්තට ගැටගැසුණු මාළුවකු මෙන් දොඹකරවලින් අලින් උස්සමින්, පහත් කරමින් ට්‍රැක්ටර්වලින් එහා මෙහා ගෙන යාමද නිර්වින්දනය කිරීම ද අද දින සාමාන්‍ය අංගයක් වී ඇත. එමෙන්ම හඳපානාගල මෙන් කැලයෙන් කැලයට අලින් පන්නා දැමීම ද එමගින් අලියා ජීවත් විය යුතු තැන පරිපාලන නිලධාරීන් විසින් තීරණය කරන්නා වූ යුගයකට අපි පැමිණ ඇත්තෙමු. මෙම තත්ත්වයත් යටතේ මිනිසා විසින් කරන විනාශය නතර වන්නේ සොබාදහම විසින් මහා පරිමාණයෙන් මිනිසාට දඬුවම් කිරීමෙන් පසුව පමණි. තව අවුරුදු අඩ සිය වසක කාලය තුළ එම දිනය ද ළඟෙනු ඇත.

සූරිය ගුණසේකර මහතා
ශ්‍රී ලංකා පරිසර සම්මේලනය

**අනේ පිංසිද්ධ වෙයි .......**

කොහොමටත් අපේ ඇයො කැමතියි. ඒත් උක් කන්න අපිට මිනිස්සු ඉඩ දුන්නේ නෑ. උක්ගස් වටකරලා විදුලි කම්බි ඇදලා ඒ කම්බිවල ගැවුණ ගමන් අපේ අලි බයවුනත් වැඩි වින්නැහියක් නම් වුනේ නැහැ.

අපෙත් ඉන්නව නාහෙට නාහන අලි. ඒ ගොල්ල කළේ ගස් විදුලි කම්බි උඩට පෙරලල ඒ තැන්වලින් උක් වගාවට රිංගා ගත්ත එක.

ඒත් අපිට ලේසි වුණේ නෑ. උන් අපිට වෙඩි තිබ්බා. අපේ අලි පනහක් විතර සැරින් සැරේ වෙඩි කාලා මළා.

දැනට අපේ අලින්ගෙන් වෙඩි නොවැදුණු අලියෙක් නැති තරම්.

ඊට පස්සෙ අපි අවට තියෙන ගම්වලට රිංග ගත්තා. නෙළුවගල, ආනපල්ලම, පුබුදුවැව, වරුණගම, හඳපානාගල වගේ ගම්වලට පැනලා කෙසෙල් ගසුයි, හේනුයි, කුඹුරුයි කන්න පටන් ගත්තා. එතකොට ඒ මිනිස්සුත් කළේ අපිට වෙඩි තියන එක. තුවක්කු නැති අය වට්ටක්කා වලට වහදාලා අපිට කැව්වා. ලී කැලිවල පරාල ඇණ හිටවල අපි යන පාරවල්වල තිබ්බා. ඒ හැම එකකින්ම වුණේ අපිට වින්නැහියක්.

මිනිස්සු අපිට ගහනකොට අපේ අය මිනිස්සුන්ට ගහන්න පටන් ගත්තා. එතකොට ඒ මිනිස්සුත් කළේ අපිට වෙඩි තියන එක. තුවක්කු නැති අය වට්ටක්කා වලට වහදාලා අපිට කැව්වා. ලී කැලිවල පරාල ඇණ හිටවල අපි යන පාරවල්වල තිබ්බා. ඒ හැම එකකින්ම වුණේ අපි මැරෙන එක.මිනිස්සු අපිට ගහන කොට අපේ අය මිනිස්සුන්ට ගහන්න පටන් ගත්තා. අපේ ඉන්නව කබරයා, තත්පරයා කියලා නාහෙට නාහන අලි ඉලන්දාරි ටිකක්. මේ ගොල්ල ගම්වලට පැනලා ගෙවල් පොඩි කළා. මිනිස්සු මරලා දැම්මා. කොහොම හරි මේ වෙන කොට අපේ ඇයො මිනිස්සු 85ක් විතර මරල දාලා තියෙනවා.

ඒත් මිනිස්සු අලි 100ට වැඩිය මරල දාලා. දැන් අපේ රංචුවෙ අලි 130ක් වත් නැතිතරම්. මේ විදියට ගියොත් අපේ අලි රංචුවෙ අලි ඔක්කොම මැරිල යාවි.

පහුගිය මාස දෙකකට විතර උඩින් බඩගින්නෙනුත් අපේ අලි දෙන්නෙක් මැරිලා තිබුණා. ඉන්න අලිත් දැන් කටුස්සො තරමට කෙට්ටුවෙලා ....

දැන් හඳපානාගල ලොකු අර්බුදයක් තියෙනවලු. අලින්ගෙයි මිනිස්සුන්ගෙයි සටනක්. ඒ කතාව බොරුවක් නෙමෙයි. ඒත් මේ ප්‍රශ්නෙට මොකද කරන්නෙ කියලා අද මිනිස්සු මිනිස්සුම දෙපිල බෙදිලා. සමහරු අපිව යාලට පටවන්න හදනවා. තවත් සමහරු හඳපානාගල තියන්න ඕනෑ කියනවා.

කොහොම හරි අපි කැමති ඉස්සර වාගෙම නිදහසේ ජීවත් වෙන්න. අපිට අපේ පාඩුවේ ඉන්න. ඒකට නම් ආයෙමත් අපේ කැලේ අපිට ඕනෑ. අපිට තිබුණු කැලෑව විනාශ කරල උක්වගා කළේ මිනිස්සු. ජනපද හදාගත්තෙ මිනිස්සු. ඒ මදිවට අපි උක් ගහක් කන්න හදනවා කියලා හේන්වලට පනිනවා කියලා අපිව මරන්නෙත් මිනිස්සු.

අපිව මරණවට අපි විරුද්ධයි. මිනිස්සු මැරෙනවටත් විරුද්ධයි. අපි කියන්නේ මෙච්චරයි. අපේ කැලේ අපිට ඕනෑ.

අදහස : හඳපානාගල දිග දළයා ගෙනි
සකස් කළේ : අබේරත්න සිටුබණ්ඩාර විසිනි